සිංහල පරිවර්තනය

**නිවේදන අංක: R/2025/18**

## උතුරු පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව යටතේ පවතින රජයේ රෝහල්වල වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක හා අතුරු වෛද්‍ය සේවාවට අයත් තනතුරුවල පවතින පුරප්පාඩු සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම - 2025

උතුරු පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක NP/04/01/Out Source Appt/Gen දරණ 2025.07.04, 2025.10.22 සහ 2025.11.14 දිනැති ලිපි සහ උතුරු පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අංක G/NPC/A8/Approval/2025/014 දරණ 2025.09.24 දිනැති අනුමැතිය ප්‍රකාරව, උතුරු පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව යටතේ පවතින රජයේ රෝහල්වල පරිපූරක වෘත්තීන්ගේ සේවාවට අයත් පහත සඳහන් තනතුරු හයකට (06) අදාළව පවතින පුරප්පාඩු සඳහා කොන්ත්‍රාත් පදනමින් බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ අනුව මෙම නිවේදනයේ 01 වගන්තියේ සඳහා සාමාන්‍ය සුදුසුකම් සහ ඒ ඒ තනතුරුවලට අදාළ ඇමුණුම්වල සඳහන් සියලු සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්හට සඳහා මේ සඳහා අයදුම් කළ හැකිය. මෙම බඳවා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණ උතුරු පළාතේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන බව මෙයින් දැනුම්දෙනු ලැබේ. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය **2025.12.31** වේ.

| අනු අංකය | තනතුර | කොන්ත්‍රාත් පදනමෙන් බඳවාගන්නා පුරප්පාඩු සංඛ්‍යාව | තනතුරට අදාළ ඇමුණුමේ අංකය |
|---|---|---|---|
| 01 | ඖෂධ සංයෝජක (Dispenser) | **25** | **I** |
| 02 | ඛන්තු රේඛන ශිල්පී (ECG Recordist) | **03** | **II** |
| 03 | වෛද්‍ය රසායනාගාර කාර්මික ශිල්පී (Medical Laboratory Technologist) | **04** | **III** |
| 04 | ඖෂධවේදී (Pharmacist) | **06** | **IV** |
| 05 | භෞතචිකිත්සක (Physiotherapist) | **03** | **V** |
| 06 | විකිරණ ශිල්පී (Radiographer) | **07** | **VI** |

### 01. සාමාන්‍ය සුදුසුකම් (සියලුම තනතුරු සඳහා)

i. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii. උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හැකි ශාරීරික යෝග්‍යතාවයකින් යුතු අයෙකු විය යුතුය.

## 02. විභාග ගාස්තුව

අයදුම්කරු, විභාග ගාස්තු ලෙස රු.500/= මුදලක් උතුරු පළාතේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයකින් **ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත** යන නමට **යාපනය ප්‍රධාන තැපැල් කාර්යාලයෙන්** මාරුකළ හැකි වන පරිදි මුදල් ඇණවුමකින් ගෙවා, අදාළ කුවිතාන්සිය අයදුම්පතෙහි අදාළ කොටුවේ නොගැළවෙන පරිදි අලවා එවිය යුතුය. කුමන හේතුවක් නිසා හෝ මෙම ගාස්තු ආපසු ගෙවනු නොලැබේ. මෙම ගාස්තුව වෙනත් විභාග සඳහා මාරු කිරීමට ද අනුමත කරනු නොලැබේ.

## 03. පුද්ගල අනන්‍යතාව තහවුරු කිරීම

අයදුම්කරුගේ අනන්‍යතාව තහවුරු කිරීම සඳහා පහත සඳහන් ලේඛනවලින් කුමන හෝ එකක් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.

(අ). පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත

(ආ). වලංගු ශ්‍රී ලංකා විදේශ ගමන් බලපත්‍රය (Passport)

(ඇ). වලංගු රියදුරු බලපත්‍රය (Driving License)

## 04. අත්සන සහතික කිරීම

සෑම අයදුම්කරුවෙකුම තමන්ගේ අත්සන සහතික කිරීම අනිවාර්යය වේ. අයදුම්කරුවන් තම අත්සන කොට්ඨාශයේ ග්‍රාම නිලධාරිවරයෙකු, නීතිඥවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, සමාදාන විනිශ්චයකාරවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි ලත් නිලධාරියෙකු, රු.854,880.00 ට නොඅඩු මාසික වැටුපක් ලබන ස්ථිර රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නිලධාරියෙකු, බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැළකිය යුතු තත්ත්වයක් දරණ අයෙකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.

## 05. අයදුම්කිරීමේ පිළිවෙල

(අ). මෙම නිවේදනය සමග අමුණා ඇති අයදුම්පත් අතරින්, ඔබ අයදුම්කරන තනතුරට අදාළ ආකෘතිපත්‍රය බාගත කරගෙන එය සම්පූර්ණ කර, **අයදුම්පත් භාර ගන්නා අවසාන දින හෝ ඊට පෙර ලැබෙන පරිදි "ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 393/48, කෝවිල් පාර, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමුකළ යුතුය.

(ආ). එක් තනතුරකට වඩා අයදුම් කරන්නේ නම්, එක් එක් තනතුර සඳහා වෙන් වෙන් වශයෙන් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

(ඇ). ඉල්ලුම්පත්‍ර බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"NP/07/10/01/190"** යනුවෙන් සඳහන් කළ යුතුය. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් සහ ඉල්ලා ඇති සුදුසුකම් සම්පූර්ණ නොකරන අයදුම්පත් සියල්ල ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ආල්වාප්පිල්ලෛ සිරි
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
උතුරු පළාත
**2025.12.15..**

## 01. ඖෂධ සංයෝජක (Dispenser)

**1.1** වැටුප:- දීමනා ඇතුළුව මෙම තනතුරට අදාළ මාසික වැටුප රු.**70,320.00** (MT-4-2025) වේ.

**1.2** **අධ්‍යාපන සුදුසුකම්:-**

i. අ.පො.ස (සා/පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ, ගණිතය, විද්‍යාව ඇතුළත්ව තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී ඉංග්‍රීසි විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව විෂයයන් හයකින් (06) සමත්ව තිබිය යුතුය.

සහ

ii. අ.පො.ස (උසස් පෙළ) විභාගයෙන් රසායන විද්‍යාව විෂයයට සම්මාන සාමාර්ථයක් සහ භෞතික විද්‍යාව විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව ජීව විද්‍යාව / සංයුක්ත ගණිතය යන විෂයයන් වලින් එක් විෂයයකට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබිය යුතුය.

**1.3** **වෘත්තීය සුදුසුකම්:-**

i. සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් පවත්වනු ලබන ඖෂධ සංයෝජනය පිළිබඳ ඩිප්ලෝමා පුහුණු පාඨමාලාවක් සම්පූර්ණ කර තිබිය යුතුය.

ii. ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි සහතිකය ලබා තිබිය යුතුය.

**1.4** **කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම සඳහා වන වයස් සීමාව:-**

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අයදුම්කරු වයස අවුරුදු **18** ට නොඅඩු සහ වයස අවුරුදු **30** ට නොවැඩි විය යුතුය.

**1.5** **කොන්ත්‍රාත් කාලසීමාව:-**

පත්වීම ක්‍රියාත්මක වන දින සිට වසරක කාලසීමාවකට හෝ මෙම තනතුරට ස්ථිර නිලධාරියෙකු පත්කිරීම දක්වා වන කාලසීමාව අතරින් පළමුව එළඹෙන කාලසීමාව දක්වා බලපැවැත්වේ.

**1.6** **බඳවා ගැනීමේ ක්‍රමය**

පහත දැක්වෙන ක්‍රමවේදයට අනුව පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයේදී අපේක්ෂකයින් ලබාගත් වැඩිම මුළු ලකුණු සංඛ්‍යාවේ අනුපිළිවෙල අනුව (Merit Order) පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගන්නා සංඛ්‍යාව සළකා බලනු ලැබේ.

| විෂයය විස්තරය | කාලය | සමත්වීම සඳහා ලබාගත යුතු ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| විෂයය දැනුම | විනාඩි 10 | 50 |

## 02. බන්තු රේඛන ශිල්පී (ECG Recordist)

**2.1** වැටුප:- දීමනා ඇතුළුව මෙම තනතුරට අදාළ මාසික වැටුප රු.**70,320.00** (MT-4-2025) වේ.

**2.2** **අධ්‍යාපන සුදුසුකම්:-**

i. අ.පො.ස (සා/පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ, ගණිතය, විද්‍යාව ඇතුළත්ව තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී ඉංග්‍රීසි විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව විෂයයන් හයකින් (06) සමත්ව තිබිය යුතුය.

**සහ**

ii. අ.පො.ස (උසස් පෙළ) විභාගයෙන් ජීව විද්‍යාව විෂයයට සම්මාන සාමාර්ථයක් සහිතව භෞතික විද්‍යාව සහ රසායන විද්‍යාව යන විෂයයන් වලට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබිය යුතුය.

**2.3** **වෘත්තීය සුදුසුකම්:-**

i. සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් පවත්වනු ලබන බන්තු රේඛන ශිල්පය පිළිබඳ එක් අවුරුදු පූර්ණ කාලීන ඩිප්ලෝමා පුහුණු පාඨමාලාව සම්පූර්ණ කර තිබිය යුතුය.

ii. ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි සහතිකය ලබා තිබිය යුතුය.

**2.4** **කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම සඳහා වන වයස් සීමාව:-**

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අයදුම්කරු වයස අවුරුදු **18** ට නොඅඩු සහ වයස අවුරුදු **30** ට නොවැඩි විය යුතුය.

**2.5** **කොන්ත්‍රාත් කාලසීමාව:-**

පත්වීම ක්‍රියාත්මක වන දින සිට වසරක කාලසීමාවකට හෝ මෙම තනතුරට ස්ථිර නිලධාරියෙකු පත්කිරීම දක්වා වන කාලසීමාව අතරින් පළමුව එළඹෙන කාලසීමාව දක්වා බලපැවැත්වේ.

**2.6** **බඳවා ගැනීමේ ක්‍රමය**

පහත දැක්වෙන ක්‍රමවේදයට අනුව පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයේදී අපේක්ෂකයින් ලබාගත් වැඩිම මුළු ලකුණු සංඛ්‍යාවේ අනුපිළිවෙල අනුව (Merit Order) පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගන්නා සංඛ්‍යාව සළකා බලනු ලැබේ.

| විෂයය විස්තරය | කාලය | සමත්වීම සඳහා ලබාගත යුතු ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| විෂයය දැනුම | විනාඩි 10 | 50 |

## 03. වෛද්‍ය රසායනාගාර කාර්මික ශිල්පී (Medical Laboratory Technologist)

**3.1** වැටුප:- දීමනා ඇතුළුව මෙම තනතුරට අදාළ මාසික වැටුප රු.**71,920.00** (MT-6-2025) වේ.

**3.2** අධ්‍යාපන සුදුසුකම්:-

(අ)

i. අ.පො.ස (සා/පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ, ගණිතය, විද්‍යාව ඇතුළත්ව තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථ සහිතව **එක් වරක දී** විෂයයන් හයකින් (06) සමත්වීම සහ **දෙවරකට නොවැඩි** වාර ගණනක දී ඉංග්‍රීසි විෂයය සමත්ව තිබිය යුතුය.

**සහ**

ii. අ.පො.ස (උසස් පෙළ) විභාගයෙන් රසායන විද්‍යාව විෂයයට සම්මාන සාමාර්ථයක් සහිතව භෞතික විද්‍යාව, ජීව විද්‍යාව, කෘෂි විද්‍යාව සහ සංයුක්ත ගණිතය යන විෂයයන් වලින් විෂයයන් දෙකකට (02) සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබිය යුතුය.

**සහ**

iii. **වෘත්තීය සුදුසුකම්:** - සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් පවත්වනු ලබන වෛද්‍ය රසායනාගාර ශිල්පය පිළිබඳ දෑ අවුරුදු පූර්ණ කාලීන ඩිප්ලෝමා පුහුණු පාඨමාලාව සම්පූර්ණ කර තිබිය යුතුය. (විශ්ව විද්‍යාල උපාධිය නොමැතිව බඳවා ගැනීම්)

**හෝ**

(ආ)

i. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් / ආයතනයකින් වෛද්‍ය රසායනාගාරවේදී උපාධිය ලබා තිබිය යුතුය. විදේශීය විශ්වවිද්‍යාලයකින් / ආයතනයකින් අදාළ උපාධිය ලබා ඇති අයෙක් නම් වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥයෙකු ලෙස ශ්‍රී ලංකාව තුළ කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි සහතිකය ලබා තිබීම.

**සහ**

ii. සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් පවත්වනු ලබන සය මාසික අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර තිබීම.

**3.3** කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම සඳහා වන වයස් සීමාව:-

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අයදුම්කරු වයස අවුරුදු **18** ට නොඅඩු සහ වයස අවුරුදු **35** ට නොවැඩි විය යුතුය.

**3.4** කොන්ත්‍රාත් කාලසීමාව:-

පත්වීම ක්‍රියාත්මක වන දින සිට වසරක කාලසීමාවට **හෝ** මෙම තනතුරට ස්ථිර නිලධාරියෙකු පත්කිරීම දක්වා වන කාලසීමාව අතරින් පළමුව එළඹෙන කාලසීමාව දක්වා බලපැවැත්වේ.

## 3.5 බඳවා ගැනීමේ ක්‍රමය

පහත දැක්වෙන ක්‍රමවේදයට අනුව පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයේදී අපේක්ෂකයින් ලබාගත් වැඩිම මුළු ලකුණු සංඛ්‍යාවේ අනුපිළිවෙල අනුව (Merit Order) පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගන්නා සංඛ්‍යාව සළකා බලනු ලැබේ.

| විෂයය විස්තරය | කාලය | සමත්වීම සඳහා ලබාගත යුතු ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| විෂයය දැනුම | විනාඩි 10 | 50 |

## 04. ඖෂධවේදී (Pharmacist)

**4.1** වැටුප:- දීමනා ඇතුළුව මෙම තනතුරට අදාළ මාසික වැටුප රු.**71,920.00** (MT-6-2025) වේ.

**4.2** අධ්‍යාපන සුදුසුකම්:-

(අ)

i. අ.පො.ස (සා/පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ, ගණිතය, විද්‍යාව ඇතුළත්ව තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථ සහිතව එක් වරක දී විෂයයන් හයකින් (06) සමත්වීම සහ දෙවරකට නොවැඩි වාර ගණනක දී ඉංග්‍රීසි විෂයය සමත්ව තිබිය යුතුය.

සහ

ii. අ.පො.ස (උසස් පෙළ) විභාගයෙන් රසායන විද්‍යාව විෂයයට සම්මාන සාමාර්ථයක් සහිතව භෞතික විද්‍යාව, ජීව විද්‍යාව, කෘෂි විද්‍යාව සහ සංයුක්ත ගණිතය යන විෂයයන් වලින් විෂයයන් දෙකකට (02) සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබිය යුතුය.

සහ

iii. **වෘත්තීය සුදුසුකම්: -** සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් පවත්වනු ලබන ඖෂධවේදය පිළිබඳ දෑ අවුරුදු පූර්ණ කාලීන ඩිප්ලෝමා පුහුණු පාඨමාලාවක් සම්පූර්ණ කර තිබිය යුතුය. (විශ්ව විද්‍යාල උපාධිය නොමැතිව බඳවා ගැනීම්)

හෝ

(ආ)

i. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් / ආයතනයකින් ඖෂධවේදී / විද්‍යාවේදී (ඖෂධවේදී) උපාධිය ලබා තිබිය යුතුය. විදේශීය විශ්වවිද්‍යාලයකින් / ආයතනයකින් අදාළ උපාධිය ලබා ඇති අයෙක් නම් ඖෂධවේදියෙකු ලෙස ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි සහතිකය ලබා තිබීම.

සහ

ii. සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් පවත්වනු ලබන සය මාසික අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර තිබීම.

**4.3** කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම සඳහා වන වයස් සීමාව:-

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අයදුම්කරු වයස අවුරුදු **18** ට නොඅඩු සහ වයස අවුරුදු **35** ට නොවැඩි විය යුතුය.

**4.4** කොන්ත්‍රාත් කාලසීමාව:-

පත්වීම ක්‍රියාත්මක වන දින සිට වසරක කාලසීමාවට හෝ මෙම තනතුරට ස්ථිර නිලධාරියෙකු පත්කිරීම දක්වා වන කාලසීමාව අතරින් පළමුව එළඹෙන කාලසීමාව දක්වා බලපැවැත්වේ.

## 4.5 බඳවා ගැනීමේ ක්‍රමය

පහත දැක්වෙන ක්‍රමවේදයට අනුව පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයේදී අපේක්ෂකයින් ලබාගත් වැඩිම මුළු ලකුණු සංඛ්‍යාවේ අනුපිළිවෙල අනුව (Merit Order) පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගන්නා සංඛ්‍යාව සළකා බලනු ලැබේ.

| විෂයය විස්තරය | කාලය | සමත්වීම සඳහා ලබාගත යුතු ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| විෂයය දැනුම | විනාඩි 10 | 50 |

## 05. භෞතචිකිත්සක (Physiotherapist)

**5.1** වැටුප:- දීමනා ඇතුළුව මෙම තනතුරට අදාළ මාසික වැටුප රු.**71,920.00** (MT-6-2025) වේ.

**5.2** **අධ්‍යාපන සුදුසුකම්:-**

(අ)

i. අ.පො.ස (සා/පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ, ගණිතය, විද්‍යාව ඇතුළත්ව තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථ සහිතව එක් වරක දී විෂයයන් හයකින් (06) සමත්වීම සහ දෙවරකට නොවැඩි වාර ගණනක දී ඉංග්‍රීසි විෂයය සමත්ව තිබිය යුතුය.

සහ

ii. අ.පො.ස (උසස් පෙළ) විභාගයෙන් භෞතික විද්‍යාව විෂයයට සම්මාන සාමාර්ථයක් සහිතව රසායන විද්‍යාව, ජීව විද්‍යාව, කෘෂි විද්‍යාව සහ සංයුක්ත ගණිතය යන විෂයයන් වලින් විෂයයන් දෙකකට (02) සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබිය යුතුය.

සහ

iii. **වෘත්තීය සුදුසුකම්: -** සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් පවත්වනු ලබන භෞත චිකිත්සක දෑ අවුරුදු පූර්ණ කාලීන ඩිප්ලෝමා පුහුණු පාඨමාලාවක් සම්පූර්ණ කර තිබිය යුතුය. (විශ්ව විද්‍යාල උපාධිය නොමැතිව බඳවා ගැනීම්)

හෝ

(ආ)

i. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් / ආයතනයකින් භෞත චිකිත්සක උපාධිය ලබා තිබිය යුතුය. විදේශීය විශ්වවිද්‍යාලයකින් / ආයතනයකින් අදාළ උපාධිය ලබා ඇති අයෙක් නම් භෞත චිකිත්සක වරයෙකු ලෙස ශ්‍රී ලංකාව තුළ කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි සහතිකය ලබා තිබීම.

සහ

ii. සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් පවත්වනු ලබන සය මාසික අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර තිබීම.

**5.3** **කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම සඳහා වන වයස් සීමාව:-**

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අයදුම්කරු වයස අවුරුදු **18** ට නොඅඩු සහ වයස අවුරුදු **35** ට නොවැඩි විය යුතුය.

**5.4** **කොන්ත්‍රාත් කාලසීමාව:-**

පත්වීම ක්‍රියාත්මක වන දින සිට වසරක කාලසීමාවට **හෝ** මෙම තනතුරට ස්ථිර නිලධාරියෙකු පත්කිරීම දක්වා වන කාලසීමාව අතරින් පළමුව එළඹෙන කාලසීමාව දක්වා බලපැවැත්වේ.

## 5.5 බඳවා ගැනීමේ ක්‍රමය

පහත දැක්වෙන ක්‍රමවේදයට අනුව පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයේදී අපේක්ෂකයින් ලබාගත් වැඩිම මුළු ලකුණු සංඛ්‍යාවේ අනුපිළිවෙල අනුව (Merit Order) පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගන්නා සංඛ්‍යාව සළකා බලනු ලැබේ.

| විෂයය විස්තරය | කාලය | සමත්වීම සඳහා ලබාගත යුතු ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| විෂයය දැනුම | විනාඩි 10 | 50 |

## 06. විකිරණ ශිල්පී (Radiographer)

6.1 **වැටුප:-** දීමනා ඇතුළුව මෙම තනතුරට අදාළ මාසික වැටුප රු.**71,920.00** (MT-6-2025) වේ.

6.2 **අධ්‍යාපන සුදුසුකම්:-**

(අ)

i. අ.පො.ස (සා/පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ, ගණිතය, විද්‍යාව ඇතුළත්ව තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථ සහිතව එක් වරක දී විෂයයන් හයකින් (06) සමත්වීම සහ දෙවරකට නොවැඩි වාර ගණනක දී ඉංග්‍රීසි විෂයය සමත්ව තිබිය යුතුය.

සහ

ii. අ.පො.ස (උසස් පෙළ) විභාගයෙන් භෞතික විද්‍යාව විෂයයට සම්මාන සාමාර්ථයක් සහිතව රසායන විද්‍යාව, ජීව විද්‍යාව, කෘෂි විද්‍යාව සහ සංයුක්ත ගණිතය යන විෂයයන් වලින් විෂයයන් දෙකකට (02) සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබිය යුතුය.

සහ

iii. **වෘත්තීය සුදුසුකම්: -** සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් පවත්වනු ලබන විකිරණ ශිල්පී දෑ අවුරුදු පූර්ණ කාලීන ඩිප්ලෝමා පුහුණු පාඨමාලාවක් සම්පූර්ණ කර තිබිය යුතුය. (විශ්ව විද්‍යාල උපාධිය නොමැතිව බඳවා ගැනීම්)

හෝ

(ආ)

i. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් / ආයතනයකින් විකිරණවේදී උපාධිය ලබා තිබිය යුතුය. විදේශීය විශ්වවිද්‍යාලයකින් / ආයතනයකින් අදාළ උපාධිය ලබා ඇති අයෙක් නම් භෞත චිකිත්සක වරයෙකු ලෙස ශ්‍රී ලංකාව තුළ කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි සහතිකය ලබා තිබීම.

සහ

ii.සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් පවත්වනු ලබන සය මාසික අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර තිබීම.

6.3 **කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම සඳහා වන වයස් සීමාව:-**

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අයදුම්කරු වයස අවුරුදු **18** ට නොඅඩු සහ වයස අවුරුදු **35** ට නොවැඩි විය යුතුය.

6.4 **කොන්ත්‍රාත් කාලසීමාව:-**

පත්වීම ක්‍රියාත්මක වන දින සිට වසරක කාලසීමාවට හෝ මෙම තනතුරට ස්ථිර නිලධාරියෙකු පත්කිරීම දක්වා වන කාලසීමාව අතරින් පළමුව එළඹෙන කාලසීමාව දක්වා බලපැවැත්වේ.

## 6.5 බඳවා ගැනීමේ ක්‍රමය

පහත දැක්වෙන ක්‍රමවේදයට අනුව පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයේදී අපේක්ෂකයින් ලබාගත් වැඩිම මුළු ලකුණු සංඛ්‍යාවේ අනුපිළිවෙල අනුව (Merit Order) පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගන්නා සංඛ්‍යාව සළකා බලනු ලැබේ.

| විෂයය විස්තරය | කාලය | සමත්වීම සඳහා ලබාගත යුතු ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| විෂයය දැනුම | විනාඩි 10 | 50 |